1956 දී "මනමේ" බිහි කිරීමෙන් අනතුරුව 1958 දී නිර්මාණය කල "රත්තරන්" සහ 1959 දී නිර්මාණය කල "එලොව ගිහින් මෙලොව ආවා" නාට්‍ය ද්විත්වය සරච්චන්ද්‍රයන්ගේ තවත් පර්යේෂණාත්මක කාර්යයක් විය. එය සරලව මෙසේ විග්‍රහ කල හැක.

පර්යේෂණ කාර්යය

අයාලේ යමින් තිබූ ශ්‍රී ලාංකික නාට්‍ය කලාවට අපේ අනන්‍යතාවය විදහාලන නාට්‍ය කලාවක් බිහිකරමින් සරච්චන්ද්‍රයන් 1956 දී "මනමේ" නාට්‍යය බිහි කලේය. ඒ වූකලී ජන සම්ප්‍රදායේ කලක් පැවතුනු රංග රීතීන්ගේ සාධනීය ලක්ෂණ විදග්ධ ප්‍රේක්ෂක සමාජයක් සඳහා ප්‍රතිනිර්මාණය කිරීමට දැරූ ප්‍රයත්නයකි. එහෙත් ඊට මදක් වෙනස් අරමුණු සහිතව "රත්තරන්" සහ "එලොව ගිහින් මෙලොව ආවා" නාට්‍යද්වය නිර්මාණය කිරීමට සරච්චන්ද්‍රයන් මුලපුරා ඇති සේය. රජ සිටු මැති චරිත වලින් තොර සරල ජන ජීවිතයේ දෛනික ගැටළු නිරූපණය කෙරෙන සරල කතා පුවතක් ඇසුරුකර ගැනීමෙන් නාට්‍ය රසය උත්පාදනයට ශෛලිගත සම්ප්‍රදාය කෙසේ උපයෝගිකරගත හැකිද? කෙසේ උපයෝගි කරගත යුතුද? යන මාවත් විවර

*අයාලේ යමින් තිබූ ශ්‍රී ලාංකික නාට්‍ය කලාවට අපේ අනන්‍යතාවය විදහාලන නාට්‍ය කලාවක් බිහිකරමින් සරච්චන්ද්‍රයන් 1956 දී "මනමේ" නාට්‍යය බිහි කලේය. ඒ වූකලී ජන සම්ප්‍රදායේ කලක් පැවතුනු රංග රීතීන්ගේ සාධනීය ලක්ෂණ විදග්ධ ප්‍රේක්ෂක සමාජයක් සඳහා ප්‍රතිනිර්මාණය කිරීමට දැරූ ප්‍රයත්නයකි.*



# "රත්තරන්" සහ "එලොව ගිහින් මෙලොව ආවා" තුළින් පෝෂණය වූ ශ්‍රී ලාංකික නාට්‍ය කලාව

කරලීමට දැරූ ප්‍රයත්නයක් සේය. ශෛලිගත සම්ප්‍රදාය විවිද වූ හිමතාර්ථයන් වෙනුවෙන් පරිහරණය කලහැකි ආකාරය විදහාලීමක් සේය.

නූතන ප්‍රේක්ෂකයාට මේ නාට්‍යද්වය ඉතා සරල නාට්‍ය ද්විත්වයක් යැයි හැඟීමට පිළිවන. එහෙත් මේ තුළින් සරච්චන්ද්‍රයන් සිදුකළ අත්හදාබැලීම, ලාංකික නාට්‍ය කලාවේ අනාගතයට ඉටුකල මගපෑදීම අතිශය වැදගත් වූවකි. රංග භූමිය මත සාමාන්‍ය ජීවන ගැටළු ආශ්‍රිත ක්‍රියා නිරූපණයට සාම්ප්‍රදායික රීතිය ප්‍රතිනිර්මාණය කිරීමට දැරුවා වූ වැදගත් ප්‍රයත්නයකි.

24 වන පිටුවට

**කුසුම්සිරි**

